Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම**
**(බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)**

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 1.1 *මාසික වැටුප් පරිමාණය :* මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL2 - 2016 වන අතර,
රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 වේ.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ).

1.2 *දීමනා :* රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

2. *වයස් සීමාව :* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.11.17 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අයදුම්කරුවන් හට මෙම තනතුර සඳහා ඉල්ලුම් කල හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

3. *අධ්‍යාපන සුදුසුකම් :* අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව සමත් වී තිබිය යුතු ය. (එකවර විෂයයන් 05ක් සමත් වී තිබිය යුතු ය.)

4. *වෘත්තීය සුදුසුකම් :*

අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම ;

*හෝ*

රජයේ හෝ රජයේ ලියාපදිංචි කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන ආහාර පිසීම/ සූපවේදය පිළිබඳව තෙමසකට නොඅඩු වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.

5. *අනෙකුත් සුදුසුකම් :*

5.1 අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
5.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.
5.3 යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

6. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7. *පළපුරුද්ද* : රජයේ හෝ පෞද්ගලික ආයතනයක වසරකට නොඅඩු කාල සීමාවක් අදළ තනතුරේ සේවය කර තිබිය යුතු අතර, පළපුරුද්ද පිළිගත හැකි ලේඛන මගින් සනාථ කළ යුතු ය.

8. *සේවා කොන්දේසි* :

* මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
  (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.)
* අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

9. *තනතුරෙහි කාර්යයන්* :

ආහාර පිළියෙල කිරීම, ආහාර පිළියෙල කරන ස්ථානය පවිත්‍රව මනා ලෙස පවත්වාගෙන යාම, නියමිත ප්‍රමිතීන් හා ආහාර වට්ටෝරු පිළිබඳ අවබෝධයක් ලබාගෙන ආහාර සකස් කිරීම, ආහාර කල්තබා ගැනීම පිළිබඳ විශේෂ ක්‍රමවේදයන් යොදා ගැනීම හා පෝෂණ ගුණය රැකෙන පරිදි ආහාර රසවත්ව පිළියෙල කිරීම.

10. *බඳවා ගැනීමේ ක්‍රමය* :

සුදුසුකම් ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

11. *අයදුම් කිරීමේ ක්‍රමය* :

මෙම *ගැසට්* නිවේදනය සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.11.17 දිනට පෙර "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.), තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2017" යනුවෙන් සඳහන් කළ යුතු ය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බවට දැනුම් දෙනු නොලැබේ.

මෙම නිවේදනය අනුව, අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවක දී ඔවුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.).

තැ. පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම**
**(බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)**

01. I. මුලකුරු සමග නම :..............................................................................................................................

II. මුලකුරුවලින් හැඳින්වෙන නම් :..............................................................................................................

..............................................................................................................................................................

02. I. ස්ථිර ලිපිනය :....................................................................................................................................

II. රාජකාරි ලිපිනය :...............................................................................................................................

III. දුරකථන අංකය : පෞද්ගලික :................................................ රාජකාරි :...............................................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.........................................................................................

04. I. උපන් දිනය :..................................................................

II. 2017.11.17 දිනට වයස : අවු. :................................, මාස :................................, දින :................................

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.)

III. ජා. හැ. අංකය :..................................................................

05. *අධ්‍යාපන සුදුසුකම්* :

(සහතික මගින් සනාථ කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

05.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

විභාගයට පෙනී සිටි වර්ෂය :................................ විභාග අංකය :................................

| | *විෂය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 1. | .................................................................. | .......................................... |
| 2. | .................................................................. | .......................................... |
| 3. | .................................................................. | .......................................... |
| 4. | .................................................................. | .......................................... |
| 5. | .................................................................. | .......................................... |
| 6. | .................................................................. | .......................................... |
| 7. | .................................................................. | .......................................... |
| 8. | .................................................................. | .......................................... |

06. වෘත්තීය සුදුසුකම් :

(බඳවා ගැනීමේ නිවේදනයේ අංක 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම්.)

හදාරන ලද පාඨමාලාවේ නම :..............................................................
පාඨමාලාවේ කාල සීමාව :................................................ සිට ........................................ දක්වා
පාඨමාලාව හදාරන ලද ආයතනය :..............................................................
සහතිකය වලංගු දිනය :..............................................................

07. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ අංක 07. අනුව ඉල්ලුම් කරන තනතුරට අදාල පළපුරුද්ද පිළිබඳ විස්තර :

........................................................................................ වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙලි වුවහොත් එසේ සාවද්‍ය බව හෙළි වූයේ තෝරා ගැනීමට පෙර නම් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තවද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.............................................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................................

08. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

........................................................................ මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ ........................................ වශයෙන් .......................දින සිට සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සේවා කාලය තුල සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බවත් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

...................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :..........................................